රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2018(I)

මගේ අංකය : MPA/ASD/03/UNION 10
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.03.14

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් හට වරලත් වෘත්තීය දීමනාව ලබා දීම</u>**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ වරලත් ඉංජිනේරුවරුන් සඳහා, 2018.02.01 දින සිට මාසික දීමනාවක් ගෙවීමට නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2018 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ වරලත් වාස්තු විද්‍යාඥයින් සඳහා ද, එම චක්‍රලේඛය ක්‍රියාත්මක වූ දින සිට, එහි විධිවිධාන ප්‍රකාරව, වරලත් දීමනාව ගෙවීම සඳහා 2018.06.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇති බව, අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/18/0857/734/013 හා 2018.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දැනුම් දී ඇත.

03. ඒ අනුව කටයුතු කිරීම මැනවි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය